දිනමිණ
The Dinamina

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2024 අප්‍රේල් 25 බ්‍රහස්පතින්දා

උමා ඔයේ හිල

උමා ඔය දෙසට උඩු බුරන ලද සියලු දෙනා, දැන් නැවත දෙපාරංශයේ ගසාගෙන අලුත් වැඩක් සොයනවා ඇත. මේවා උපන් ඇදය. සමහරුන්ට එවැනි ආබාධ ඇත්තේය. එදිනෙදා වචනයෙන් මේ ගැන කියන්නේ 'උපන් බකල්, කොයි වින්කලේට දැම්මත් ඇරිය නොහැකිය' කියාය.

ජවිපෙ එදා සිටම මේ ජාතියේ කතා කීම, සිය දේශපාලනයේ කොටසක් කර ගත්තේය. 1970 වසර පමණ වන විට ඇල්ල - වැල්ලවාය පාර පුළුල් කර ඉදිකිරීමට ආණ්ඩුව පියවර ගත්තේය. ඒ සඳහා විශාල මහජන ප්‍රසාදයක් ගලාගෙන ආවේ, කල් තියා අලින්ගේ ප්‍රහාර වළක්වා ගැනීමට මෙවැනි පුළුල් මාවත් හේතුවක් වන්නේ බැවිනි. වංගු අඩු සහ වාහන දෙකකට හිතේ හැටියට මාරු විය හැකි ආකාරයට, ග්‍රාමීය ප්‍රධාන මාර්ගයක් පුළුල් වන කල්හි එම පළාතේ ජනී ජනයාගේ ආර්ථිකය ද ප්‍රසාරණය වන්නේය. මේ නිසා ඒ අවට ජනතාව ආණ්ඩුවට ප්‍රශංසා කරමින්, මෙම නව මාවත පිළිගත්තේය. විජේවීර මේ පාර පිළිබඳව ප්‍රසිද්ධියේ කතා කරමින් පවසන ලද්දේ, ඇල්ල - වැල්ලවාය පාර පුළුල් කරමින් ඉදිකරන ලද්දේ, අමෙරිකානු ප්‍රහාරක ගුවන්යානා ගොඩබෑම සඳහා ධාවන පථයක් ලෙස බවය. මේ කාලයේ බෙන්තොට බීච් හෝටලය ඉදිකරමින් තිබුණි. ඒ සා විශාල ඉදිකිරීමක් සංචාරක හෝටලයක් නොවන බව විජේවීරගේ මතය විය. ඔහු ඒ ගැන සඳහන් කළේ එක්සත් ජනපද බුද්ධි සේවා මූලස්ථානයක් ලෙස එම ගොඩනැඟිල්ල ඉදිවෙන බවය.

ඡන්ද කාලයට ගැලරිය 'කික්' එකේ තබා ගැනීම සඳහා ඔහොම කතා, දේශපාලන පක්ෂ සමහරක් කියන්නේය. ජවිපෙට මේ සාධකය විශේෂ වන්නේ, හැම කාලයටම මේ වගේ කතා කියාගෙන යෑම, එහි අනිවාර්ය දේශපාලන අංගයක් බැවිනි. සංවර්ධන ව්‍යාපෘති සිදු කරන කල්හි සියයට තුනේ කල්ලියට ඇගේ දැවිල්ලක් හට ගන්නේය. වාවා ගත නොහේ, පාරට එන්නේය. දක්ෂිණ අධිවේගය සාදන විට ඒ සඳහා පවසන ලද්දේ, මහින්ද රාජපක්ෂට දවල් කෑමට මාළු ඇඹුල් තියල් ගෙන්වා ගැනීමට මෙම මාවත ඉදිකරන බවය. ඒ අනුව දිනපතා මහින්ද රාජපක්ෂ මාළු හට්ටිය බැගින් එම මාවතේ ගෙන්වාගත යුතුය. ඇඹුල් තියල් සෑදීම කොළඹ වුවද කළ හැක්කේය. එය පහසු කටයුත්තකි. එසේ තිබියදී අධිවේගයක් සාදාගෙන යමෙක් මාළු ඇඹුල් තියල් හට්ටිය ගානේ දිනපතා ගෙන්වා ගනීද...? ඇඹුල් තියල් වනාහි කල්තියා ගත හැකි ආහාරයකි. එසේ නම් සතියකට වතාවක් ඇඹුල් තියල් ගෙන්වා තබා ගත නොහැක්කේ මන්ද...? යැයි කිසිවෙක් ජවිපෙන් පෙරළා ඇසුවේ නැත.

එසේ නොඇසීමේ ප්‍රතිපලය වූයේ, හම්බන්තොට ගල, උමා ඔය හිල වැනි කතා ගොත ගොතා ජවිපෙ විසින් කරළියට ගෙන ඒමය. ජවිපෙ ද බලයට ගෙන ආ යහපාලන ආණ්ඩුව හම්බන්තොට වරාය චීනයට විකුණන ලද්දේය. ගල් ඇති, නැව් නොඑන වරායක්, එහෙම විකුණා දැමිය හැකිද...? හම්බන්තොට වරාය දැන් ජාත්‍යන්තරව පිළිගත් වරායකි. එය විශාල බහාලුම් මෙහෙයුම් කටයුතු සහ ලෝකයේ ඇති සුවිශාල නැව් මෙහෙයුම් කටයුතු කළ හැකි වරායකි. ජවිපෙ හම්බන්තොට වරායට නොකියූ දෝෂයක් නැත. දැන් ඒ කතා නැත. වරායේ වැඩ ද සාර්ථකව ඉටු කෙරෙමින් යන්නේය. ජවිපෙ එහෙම බයිලා ගැසුවා කියා, එම පිරිසට ද ලජ්ජාවක් නැත්තේය.

සමන්ත විද්‍යාරත්න තෙමේ, උමා ඔය පිළිබඳව මාධ්‍ය සාකච්ඡාවකදී පළ කළ අදහසක් මේ තීරුව උපුටා දැක්වීමට රිසි යැ. "මේක බහු විනාශකාරී ව්‍යාපාරයක්. මේක කරන්න එපා... ඇහුවද... නෑ. ඔන්න පටන් ගත්තා. මම මේකත් කියන්න ඕන. ඔය වැල්ලවාය, මොණරාගල, බුත්තල, තණමල්විල පැත්තේ ඉන්න සහෝදර ජනතාවට වතුර ප්‍රශ්නයක් තියෙනවා. අපි වතුර දිය යුතුයි. නමුත් මේ කියන මධ්‍ය කඳුකරයේ මේ ව්‍යාපෘතිය කරන ඉසව්වේ අභ්‍යන්තර පාෂාණ පද්ධතිය උමං මාර්ගවලට හරියන්නේ නෑ. අපි උඩින් හෝ වෙන මඟකින් හෝ වතුර ගෙනියමු. මේක නම් කරන්න එපා කිව්වා... ඇහුවද... නෑ, දැන් කරන්න දෙයක් නෑ. කරගෙන ගිහින් මැදදී ඇන ගත්තා. දැන් මේ වෙලාවේ කරන්න ඕන දේ තමයි වහාම අර මධ්‍යම කඳුකරයේ අභ්‍යන්තර හදවතින් වෑස්සෙන ඒ මහා දිය කාන්දුව වහන්න ඕන. දවසකට වතුර ලීටර් විසිදෙකෝටි ගණනක් මේ උමඟ ඔස්සේ එළියට එනවා. ඒක මොන ක්‍රමයකින් හරි වහන්න ඕන. ඊළඟට මේ කඳුකරයේ නැගෙනහිර බෑවුමේ පන්සල් පල්ලි කෝවිල්ද ඇතුළුව නිවාස 7037 ක් විනාශයක අවදානමකට මුහුණදීලා තියෙනවා. මංමාවත් අවදානමට මුහුණ පා තියෙනවා. බණ්ඩාරවෙල නගරයේ එක්කොටසක් හිලා බහිනවා. තව කොටසක් ඉරිතලලා විනාශ වෙලා තියෙනවා. සිඳී ගිය ළිං දියකඳුරු ජල පහරවල් පොකුණු 3112 යි. අක්කර දහස් ගණනක් වගා බිම් අත හැරිලා. රැකියා දස දහස් ගණනක් නැතිවෙලා."

මේ බෙරිහන්දීම දැන් කන්කෙඳිරියක් සේ වත් ඇසෙන්නේ නැත. සැඟව පලා ගොස් ඇති 'උමා ඔයේ හිල' හෙට අනිද්දාට අලුත් වැඩක් අරගෙන පිටියට බසිනවා ඇත.

මේ කඩාකප්පල්කාරී වැඩ, එක් අයෙක්ගේ වෑයමක් පමණක් නොවේ. පළමුව එකෙක් කතාව ගොතා ගනියි. ඊළඟට පහළ කාඩරයේ ඇති ප්‍රචාරක අංශය 'අතින් දමා' වැඩේ පතුරුවා හරින්නේ ඇහෙන් දැක්කා සේය. ෆේස්බුක් බලකාය සහ සමාජමාධ්‍යයේ තවත් පිරිසක් වෙත්. එයින් පිරිසක් 'ඊනියා මධ්‍යස්ථ මතධාරීහු' මේ ගොඩට දමාගෙන, ඉන්ටර්විව් ගනිති. ඔහොම කළ කල්හි උමා ඔය යනු, වහා නවතා දැමිය යුතු මහා අපරාධයකි. සමන්ත විද්‍යාරත්න තෙමේ, දැන් කොයිදැයි සොයා ගෙන, ඔහුගේ වචනයෙන් 'මේක බහු විනාශකාරී ව්‍යාපාරයක්' යන්න මේ රටේ ජනතාව නිර්වචනය කරගත යුත්තේය. ඔය දේශපාලන ව්‍යාපාරයේ උපන් ඇද ඇරීම සඳහා ජනතා බලවේගය දැන් වින්කලයක් විය යුත්තේය.

මැලේරියාව බහුලවම ඇති බෝවන රෝගවලින් එකකි. එය දැඩි මහජන සෞඛ්‍ය ගැටලුවකි. මෙම රෝගය ඇති කරනු ලබන්නේ ප්ලස්මෝඩියම් ගණයට අයත් ඒක සෛලික පරපෝෂිතයක් මඟිනි. අද (අප්‍රේල් 25) දිනට ලෝක මැලේරියා මර්දන දිනය යෙදී ඇත. කැලණිය විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ පරපෝෂිත විද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපති ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය නුවනි මනම්පේරි මහත්මිය සමඟ පැවැත්වූ සංවාදයකි.

මැලේරියා රෝගයේ පරපෝෂිතයා නැතත් වාහක මදුරුවා රට තුළ ව්‍යාප්තයි

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය **නුවනි මනම්පේරි**

මැලේරියා රෝගයේ ඉතාම දරුණු තත්ත්වය මොළයේ මැලේරියාවයි

මැලේරියාව බහුලව ව්‍යාප්තව තිබෙන්නේ ඉන්දියාව සහ දකුණු ආසියාතික කලාපයේ රටවල්වලයි

සංකූලතා ඇතිවීමට පෙර ප්‍රතිකාර කිරීමට හැකිවුවොත් රෝගියා සුව කරගත හැකියි

උපදෙස් වගේම ඖෂධත් නිසි පරිදි ගැනීමෙන් පිටරටකදී මැලේරියාව වැලඳීම වළක්වා ගත හැකියි

● මැලේරියාව කියන්නේ මොනවගේ රෝගී තත්ත්වයක් ද?

මැලේරියාව කියන්නේ මදුරුවන්ගෙන් බෝවන පරපෝෂිතයකු මඟින් ඇති කරන රෝගයක්. මෙම පරපෝෂිතයා Protozoa සත්ත්ව කාණ්ඩයට අයත් ප්ලැස්මෝඩියම් ගණයේ එක ජීවියෙක්. මිනිසාට මැලේරියාව ඇති කරන ප්ලැස්මෝඩියම් විශේෂ කිහිපයක් හඳුනාගෙන තිබෙනවා. වාහක මදුරුවා Anophelus ගණයට අයත් වෙනවා. නිසි කලට නිසි ප්‍රතිකාර ලබාදීමෙන් මැලේරියාව වැලඳුණු රෝගයකුට පූර්ණ සුවය ලබාදිය හැකියි. නිසි ප්‍රතිකාර නොගතහොත් සංකූලතාවලට ලක්වී මරණයට පවා පත්වෙන්න පුළුවන්.

● මැලේරියා රෝගය බෝවන ආකාරය පැහැදිලි කළොත්?

මැලේරියා ආසාදිත පුද්ගලයකුගෙන් නීරෝගී පුද්ගලයකු වෙත මැලේරියා පරපෝෂිතයා ගෙනයාමට රෝග වාහකයා ලෙස කටයුතු කරන්නේ Anophelus ගණයේ ගැහැනු මදුරුවන්. මෙම මදුරුවන් ලේ උරා බීමේදී මිනිස් ශරීරය තුළට පරපෝෂිතයා ඇතුළු වී රෝගය බෝ කරයි. සාමාන්‍යයෙන් රාත්‍රී කාලයේදී තමයි මේ මදුරුවන් ලේ උරා බොන්නේ. මේ මදුරු විශේෂය ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ බහුලව ව්‍යාප්ත වෙලා තිබෙනවා.

● මැලේරියා රෝගය ගෝලීය වශයෙන් ව්‍යාප්ත වෙලා තියෙන්නේ කොහොමද? වසරකට කොපමණ රෝගීන් ප්‍රමාණයක් හඳුනා ගන්නවා ද?

දැනට ලෝකයේ රටවල් 88 ක පමණ මැලේරියාව ව්‍යාප්තව පවතිනවා. වැඩි වශයෙන් පවතින්නේ නයිජීරියාව, කොන්ගෝ රාජ්‍ය, උගන්ඩාව, මොසැම්බික්, ටැන්සානියාව වැනි අප්‍රිකානු මහද්වීපයේ රටවලයි. ඊට අමතරව ඉන්දියාව, බංග්ලාදේශය, පාකිස්ථානය වැනි දකුණු ආසියාතික රටවලත් ඉන්දුනීසියාව, මියන්මාරය, තායිලන්තය, දකුණු කොරියාව වැනි අග්නිදිග ආසියාතික රටවල් සහ වෙනිසියුලාව, බ්‍රසීලය, කොලොම්බියාව, මෙක්සිකෝව වැනි ලතින් ඇමරිකානු රටවලත් මැලේරියාව ව්‍යාප්තව පවතිනවා. ගෝලීයව වසරකට මැලේරියා රෝගීන් මිලියන 200 කට අධිකව වාර්තා වන අතර ලක්ෂයකට වැඩි පුද්ගල මරණ සංඛ්‍යාවක් වාර්තා වෙනවා. මරණ වැඩි ප්‍රතිශතයක් වාර්තා වෙන්නේ අප්‍රිකානු රටවලයි. ඉන් සැලකිය යුතු ප්‍රතිශතයක් වයස අවුරුදු 5ට අඩු දරුවන් වෙනවා. දැනට වසරකට රෝගීන් 40ක් පමණ මෙරටින් වාර්තා වෙනවා. ඔවුන්ගෙන් බහුතරයකට රෝගය වැලඳී ඇත්තේ අප්‍රිකානු රටවලදී හෝ ඉන්දියාවේදී.

● මෙම රෝගයේ රෝග ලක්ෂණ මොනවාද?

මේ රෝගයේ රෝග ලක්ෂණ ලෙස එක දිගට පවතින හෝ වරින්වර ඇතිවන උණ, උණත් සමඟ ඇඟ සීතල කිරීම හා වෙව්ලීම, ඇඟපත වේදනාව, ඇඟපත දුර්වල ගතිය, හිසරදය රෝගයේ මුල් අවධියේ අපිට හඳුනාගන්න පුළුවන් රෝග ලක්ෂණයි. ඒ වගේම රෝග සංකූලතා ඇතිවුවහොත් වලිප්පුව, සිහිමද ගතිය, ඇස් කහවීම, මුත්‍රා පැහැය වෙනස්වීම, හුස්ම ගැනීමේ අපහසුතාව වගේ රෝග ලක්ෂණ දැක ගන්න පුළුවන්. මැලේරියා රෝගයේ ඉතාම දරුණු තත්ත්වයක් ලෙස මොළයේ මැලේරියාව හඳුන්වන්න පුළුවන්. මෙය ඉතාම ඉක්මනින් හඳුනා නොගතහොත් රෝගියා මරණයට පත්වීම නොවැළැක්විය හැකි වෙනවා.

● මැලේරියා රෝගයේ රෝග ලක්ෂණ වෙනත් උණ රෝගවලින් වෙනස් වෙනවා ද? (ඩෙංගු, ඉන්ෆ්ලුවෙන්සා)

බොහෝදුරට මැලේරියා රෝගයේ රෝග ලක්ෂණ වෙනත් රෝගවලදීද අපට දැකගන්න පුළුවන් වෙනවා. වරින්වර ඇතිවන උණක් මැලේරියා රෝගයේදී දැකගන්න පුළුවන් වෙන අතර එකදිගට පවතින උණක් වුවත් ඇතිවෙන්න පුළුවන්. මෙම රෝගයේදී ඇතිවන උණ තත්ත්වය වෙනත් බෝවන රෝගවල රෝග ලක්ෂණවලින් සායනිකව වෙන් කරලා හඳුනා ගන්න අපහසුයි. එමෙන්ම කලාතුරකින් උණක් නොමැති වන්නටත් පුළුවන්. ඒ නිසා විශේෂයෙන්ම විදේශගතව පැමිණි අයෙක් නම් විදේශගත වී පැමිණි බව නොසඟවා වෛද්‍යවරයාට පැවැසිය යුතු වෙනවා. එවිට උණ රෝගය මැලේරියාව ලෙස අනුමාන කරලා රෝගය හඳුනා ගැනීමට පහසු වෙනවා. ඒ සඳහා අවශ්‍ය පරීක්ෂණවලට යොමු කිරීමේ හැකියාව ඒ හරහා ලැබෙනවා.

● මැලේරියා පරීක්ෂණවලට යොමු වන්නේ කෙසේ ද?

මැලේරියාව හඳුනා ගැනීමට ප්‍රධාන වශයෙන් තිබෙන පරීක්ෂණය වන්නේ රුධිර පටල අන්වීක්ෂයක් මඟින් පරපෝෂිතයන් සිටිනවා ද කියලා පරීක්ෂා කිරීම. බොහෝ රජයේ රෝහල්වල සහ මැලේරියා මර්දන ව්‍යාපාරය මඟින් නොමිලේ මෙම පරීක්ෂණ සිදු කරනවා. ඊට අමතරව මැලේරියා ප්‍රතිදේහජනක රුධිරයේ තිබෙනවා ද යන්න විශේෂ පරීක්ෂණවලින් දැනගන්න පුළුවන්. ඔබට මැලේරියාව වැලඳී ඇතැයි අනුමාන කළහොත් වෛද්‍යවරයා විසින් අදාළ පරීක්ෂණවලට යොමු කරනු ලබනවා.

● මැලේරියා රෝගයේ අවදානම් පාර්ශ්ව කවුරුන් ද?

ශ්‍රී ලංකාව තුළ වර්තමාන ජනගහනයෙන් වැඩි ප්‍රතිශතයක් මැලේරියාවට ගොදුරු නොවුවන්. එම නිසා මැලේරියාවට එරෙහි ප්‍රතිශක්තිය ඔවුන් තුළ ගොඩනැඟී නැහැ. එබැවින් රෝගය වැලඳීමේ සහ රෝගයේ සංකූලතාවලට ලක්වීමේ ප්‍රවණතාවක් තිබෙනවා. නමුත් අපේ රට තුළ දැනට පරපෝෂිතයන් නොමැති නිසා මැලේරියාව බහුල ලෙස ව්‍යාප්තව පවතින රටවල සංචාරයේ නිරතවන පුද්ගලයන් මේ රෝගයට ගොදුරු වීමේ අවදානමක් තියෙනවා. මැලේරියාව බහුලව ව්‍යාප්තව තිබෙන රටවල් ලෙස ඉන්දියාව සහ දකුණු ආසියාතික කලාපයේ අනෙකුත් රටවල්, අප්‍රිකානු රටවල්,අග්නිදිග ආසියාතික රටවල් සහ ලතින් ඇමෙරිකානු රටවල් හඳුනාගන්න පුළුවන්.මේ රටවල සිට පැමිණෙන සාමසාධක කටයුතුවලට සහභාගි වූ ත්‍රිවිධ හමුදා නිලධාරීන්,වන්දනාකරුවන්,සංචාරකයින් ව්‍යාපාරිකයින්,විදෙස් අධ්‍යාපනය ලබා පැමිණෙන සිසුන් මේ මැලේරියා රෝගයට ගොදුරු වීමේ වැඩි ප්‍රවණතාවක් තිබෙනවා.ඒ වගේම අනෙකුත් පුද්ගලයන්ට සාපේක්ෂව ගර්භණී මව්වරුන් සහ කුඩා දරුවන්ට රෝගය වැලඳීමේ සහ සංකූලතා ඇති වීමේ වැඩි අවදානමක් පවතිනවා.

● මැලේරියා රෝගය වැලඳීම වළක්වා ගන්න පුළුවන් කොහොමද?

මැලේරියාව බහුලව පවතින රටක සංචාරය කිරීමට පෙර මැලේරියා මර්දන ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යාලය හෝ ප්‍රාදේශීය කාර්යාල අමතා අවශ්‍ය ඖෂධ හා උපදෙස් ලබාගත යුතුයි.එමෙන්ම බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ සෞඛ්‍ය සායනයෙන්ද මෙම ඖෂධ ලබාගත හැකිය.එම ඖෂධ වෛද්‍ය උපදෙස් අනුව එම රටට පිටත් වීමට පෙර සිටම ලබාගත යුතුයි.එමෙන්ම එම රට තුළදී මදුරු දෂ්ටනය වළක්වා ගැනීමට මදුරු විකර්ශක (repellant) භාවිතය, එළිමහනේ සිටින විට ශරීරය ආවරණය වන ලෙස ඇඳුම් ඇඳීම, රාත්‍රී කාලයේ මදුරුදැල් භාවිතය වැනි ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුයි. මෙරටට පැමිණි පසු අදාළ රුධිර පරීක්ෂණවලට යොමුවීම වැදගත්. එසේම මෙරටට පැමිණ වසරක් වත් ගතවනතුරු ඔබට වැලඳෙන උණ හෝ වෙනත් රෝග තත්ත්වයකදී ඔබ මෙවැනි රටක සංචාරය කළ බව වෛද්‍යවරයාට පැවැසිය යුතු වෙනවා.

● රෝගීන් හඳුනාගැනීම හා නිසි ප්‍රතිකාරවලට යොමු වීම කෙතරම් වැදගත් ද?

රෝගීන් ඉක්මනින් හඳුනා ගැනීම කාරණා දෙකක් නිසා ඉතා වැදගත්. රෝගියාට සංකූලතා ඇති වීමට පෙර ප්‍රතිකාර කිරීමට හැකිවීම පළමු වැන්නයි. ඒ හරහා රෝගියා සුව කරගත හැකියි. වර්තමානයේ ලංකාව මැලේරියා රෝගයෙන් තොර රටක් ලෙස සලකනවා. මේ රෝගයේ පරපෝෂිතයා විතරයි රටේ නැත්තේ. නමුත් වාහක මදුරුවා රට තුළ ව්‍යාප්තව සිටිනවා. එම නිසා මේ රෝගීන්ගෙන් අන් අයට රෝගය පැතිරීමේ අවදානමක් තිබෙනවා. මේ නිසා රට තුළ නැවත මැලේරියා පරපෝෂිතයා ව්‍යාප්ත වීම වැළැක්වීමට රෝගීන් ඉක්මනින් හඳුනාගෙන ප්‍රතිකාර කළ යුතු වෙනවා. එමෙන්ම ඔබට රෝග ලක්ෂණ පහව ගියත් වෛද්‍යවරයා නිර්දේශ කරන මුළු කාලය පුරාවට ප්‍රතිකාර ගැනීම වැදගත්.

● මැලේරියා මර්දනය කළ රටක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්වුවත් වර්තමානයේ මැලේරියා රෝගීන් වාර්තා වෙනවා. මෙයට හේතු මොනවා ද?

මෙරට තුළදී මැලේරියා වැලඳුණ රෝගියක් අවසන් වරට වාර්තා වුණේ 2012 වර්ෂයේ. 2012 න් පසු දැනට වාර්තාවන රෝගීන් සියලු දෙනාම වෙනත් රටවලදී පරපෝෂිතයා ආසාදනය වුවන් ලෙස හඳුනාගන්න පුළුවන්. එම නිසා ඉහත කී මැලේරියා බහුල රටක සංචාරය කිරීමට ඔබ බලාපොරොත්තු වෙනවා නම් ඒ රටට පිටත් වීමට දින 10කටවත් පෙර මැලේරියා මර්දන ව්‍යාපාරයට ඒ බව දන්වා ඔවුන් නොමිලේ ලබා දෙන මැලේරියා මර්දන ඖෂධ සහ අනෙකුත් මදුරු දෂ්ටන වළක්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාගන්න පුළුවන්. මැලේරියා මර්දන ව්‍යාපාරයේ වෙබ් අඩවියෙන් සහ දුරකථන අංක අමතා මේ පිළිබඳ වැඩිපුර තොරතුරු ලබාගන්න පුළුවන්. මෙම උපදෙස් සහ ඖෂධ නිසි ලෙස ලබා ගැනීමෙන් ඔබට පිටරටකදී මැලේරියාව වැලඳීම වළක්වා ගත හැකියි.

● ශ්‍රී ලංකාවෙන් මැලේරියා රෝගය තුරන් කිරීමට ගෙන ඇති පියවර සහ එහි සාර්ථකභාවය?

මැලේරියා මර්දන ව්‍යාපාර සහ සෞඛ්‍ය අමාත්‍යාංශය මැලේරියා රෝගය රටින් තුරන් කිරීම සඳහා විශාල කාර්යභාරයක් ඉටු කර තිබෙනවා. එම නිසා 2016 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව මැලේරියාවෙන් තොර රටක් ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය සහතික කර තිබෙනවා. වර්තමානයේ ඔවුන් ක්‍රියාත්මක වන්නේ ශ්‍රී ලංකාවේ නැවත මැලේරියා රෝගය ස්ථාපිත වීම වැළැක්වීමටයි. ඒ සඳහා අරගෙන තිබෙන ක්‍රියාමාර්ග විදිහට මැලේරියාව හඳුනා ගැනීමේ පරීක්ෂණ නොමිලේ සිදු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම සිදු කරනවා. විදේශගත වී පැමිණෙන අයට ගුවන් තොටුපළේ දී පවා මේ පහසුකම් ලබා ගන්න පුළුවන්. ඒ වගේම රෝගීන්ට ප්‍රතිකාර ලෙස හෝ රෝගය වැලඳීම වැළැක්වීමට ගන්නා ඖෂධ නොමිලේ ලබාදීමට පහසුකම් ලබාදී තිබෙනවා. ඒ වගේම විදෙස්ගත වන්නන්ට අවශ්‍ය උපදෙස් සහ ඖෂධ ලබාදෙනවා. ශ්‍රී ලංකාවේ දැනට වාර්තා වන රෝගීන් සම්බන්ධයෙන් වාර්තා ඉක්මනින් ලබාගෙන ඔවුන්ට ඉක්මනින් ප්‍රතිකාර ලබාදීමට මැලේරියා මර්දන ව්‍යාපාරය කටයුතු කරනවා. එමෙන්ම රෝගියෙක් වාර්තා වුවහොත් එම ප්‍රදේශයේ වෙනත් මැලේරියා රෝගීන් සිටිත් දැයි මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් මඟින් සොයා බැලීම සිදු කරනවා. මෙවැනි අවස්ථාවකදී ඔවුනට සහය දැක්වීම මහජනතාවගේ වගකීමක්. වඩාත් දැනුම්වත් බව තුළින් හා රෝගීන් ඉක්මනින් හඳුනා ගැනීම මගින් මැලේරියාව නැවත රට තුළ ව්‍යාප්තවීම වළක්වා ගන්න පුළුවන්.

රුවන් පුෂ්පකුමාර,
සන්නිවේදන හා මාධ්‍ය ඒකකය,
කැලණිය විශ්වවිද්‍යාලය.